මගේ අංකය
எமது இல
My No.
VV/4/7,10,14,15

ඔබේ අංකය
Your No.
உமது இல

දුරකථනය
தொலைபேசி
Telephone
011-2853615
011-2853777
011-2856201
011-2856202

# ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
## இலங்கைத் திறந்த பல்கலைக்கழகம்
## THE OPEN UNIVERSITY OF SRI LANKA

තැපැල් පෙට්ටිය 21
නාවල
නුගේගොඩ

அஞ்சற் பெட்டி 21
நாவல
நுகேகொட

Post Office Box 21
Nawala
Nugegoda

*Fax: 0112856200*
*E mail: sarexam@ou.ac.lk*

**03 වන සැසිය (2023 ජූලි 19 දින ප.ව. 3.00 සිට ප.ව. 4.30 දක්වා )**

2023 ජූලි 04 දින

ගරු ස්වාමීන් වහන්ස/ පූජකතුමනි,

ප්‍රිය මහත්මයාණෙනි/ මහත්මියනි / මෙනෙවියනි,

## උපාධි ප්‍රදානෝත්සවය -2022 (ii)

**ගුරු අධ්‍යාපනය පිළිබඳ (ජාත්‍යන්තර) ශාස්ත්‍රපති උපාධිය/ දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය / අධ්‍යාපනපති උපාධිය / ගුරු අධ්‍යාපනපති උපාධිය / දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ පශ්චාත් උපාධිය / ද්වි භාෂා අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව / විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව / දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව / දෙවන බසක් ලෙස ඉංග්‍රීසි සාහිත්‍ය ඉගැන්වීම පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව / වෘත්තීය ඉංග්‍රීසි පරිචය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව/ අධ්‍යාපනවේදී නාට්‍ය හා රංගකලා ගෞරව උපාධිය / අධ්‍යාපනවේදී ස්වභාවික විද්‍යා ගෞරව උපාධිය / විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ ගෞරව උපාධිය**

ඉහත සඳහන් උපාධි ප්‍රදානෝත්සවය කොළඹ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී 2023 **ජූලි මස 19** වන දින **ප.ව. 3.00** ට පැවැත්වීමට නියමිතය.

උපාධි ප්‍රදානෝත්සවය සාර්ථක කර ගැනීම සඳහා පහත දැක්වෙන උපදෙස් මැනවින් පිළිපැදිය යුතු බව කරුණාවෙන් සලකන්න.

**01.** 2023 ජූලි මස 19 වන දින බණ්ඩාරණායක සම්මන්ත්‍රණ ශාලාවට පැමිණෙන විට හා උපාධි ලෝගු ලබා ගැනීම හා උපාධි ලෝගු භාර දී සහතික පත් ලබා ගැනීම ආදී කාර්යයන්හිදී ජාතික හැඳුනුම්පත සහ ශිෂ්‍ය වාර්තාපොත අනිවාර්යයෙන්ම රැගෙන ආ යුතුය.

**02. ඔබගේ අංකය :**

අපේක්ෂක පෙරහැරෙහි ඔබ ගමන් කළයුතු ස්ථානය, ලෝගුව, බාපනය ලබා ගැනීම හා ආපසු භාරදීම, සහතිකය ලබා ගැනීම ආදී උපාධි ප්‍රදානෝත්සවයට අදාළ සියලු කාර්යයන්හි දී හඳුන්වනු ලබන්නේ ප්‍රවේශ පත්‍රයෙහි දක්වා ඇති ඉහත සඳහන් අංකයෙනි. එම නිසා උපාධි ප්‍රදානෝත්සවය සම්බන්ධ සියලු කටයුතුවලදී **මෙම ප්‍රවේශ පත්‍රය ඔබ ළඟ තබාගත යුතුය.**

**03. ලෝගුව/හිස්වැස්ම*/බාපනය** ලබාගැනීම :**

කොළඹ ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ ලියාපදිංචි උපාධිලාභීන් හට ලෝගුව/හිස්වැස්ම/බාපනය නාවල පිහිටි විභාග අංශය මගින් නිකුත් කෙරේ. වෙනත් ප්‍රාදේශීය/ අධ්‍යයන මධ්‍යස්ථානයන්හි ලියාපදිංචි උපාධිලාභීන්ට අදාළ ප්‍රාදේශීය මධ්‍යස්ථානයෙන් පමණක් ලෝගුව/හිස්වැස්ම/බාපනය ලබාගත හැක. **ලියාපදිංචි ප්‍රාදේශීය මධ්‍යස්ථානයෙන් හැර වෙනත් ස්ථානයකින් ලෝගුව/හිස්වැසුම /බාපනය ලබාගත නොහැකි බව කාරුණිකව සලකන්න.** ලෝගුව/ හිස්වැස්ම/ බාපනය ලබාගැනිම සඳහා උපාධිලාභියාට

පැමිණීමට නොහැකි අවස්ථාවකදී **ඒ පිළිබඳ බලය පවරන ලිපියක් හා ශිෂ්‍ය වාර්තා පොතද සමඟ වෙනත් අයෙකු** එවිය හැක. ඒ සඳහා මෙම ලිපිය ඉදිරිපත් කිරීම අනිවාර්ය බව කාරුණිකව සලකන්න.

**ලෝගුව/හිස්වැසුම /බාපනය ලබා** ගැනීම සඳහා විශ්වවිද්‍යාලයට ගෙවීමට ඇති හිඟ මුදල් වෙතොත් එම මුදල් ගෙවා අවසන් කර තිබීම අනිවාර්ය බව කාරුණිකව සලකන්න.

ලෝගුව/හිස්වැස්ම/බාපනය නිකුත් කිරීම

නාවල, විභාග අංශයෙන් 2023 ජූලි මස 14 දින සිට 2023 ජූලි මස 17 දින දක්වා (පෙ.ව. 09.30 සිට ප.ව. 03.30 දක්වා)

ප්‍රාදේශීය මධ්‍යස්ථානයන් වෙතින් 2023 ජූලි මස 14 දින සිට 2023 ජූලි මස 16 දින දක්වා (පෙ.ව. 09.30 සිට ප.ව. 03.30 දක්වා)

**04. ඡායාරූප ලබාගැනීම**

උපාධිලාභීන් තම ඡායාරූප ලබාගැනීමේ කටයුතු අංක 236, ගාලු පාර,ගල්කිස්ස ලිපිනයෙහි ස්ථාපිත ස්ටුඩියෝ ලක්දම් පුද්ගලික සමාගම, මගින් සපුරා ගතයුතු අතර ඒ පිළිබඳ වැඩිදුර තොරතුරු පහත වෙබ් යොමුව වෙතින් ලබා ගත හැකිය.

https://shorturl.at/lAEIK

**සැලකිය යුතුයි** - ඡායාරූප ලබාගැනීමේ කටයුතු උපාධිලාභීන් සහ ස්ටුඩියෝ ලක්දම් පුද්ගලික සමාගම අතර සිදු කරන ගනුදෙනුවක් වන අතර ඒ සම්බන්ධයෙන් කිසිදු වගකීමක් විශ්වවිද්‍යාලය විසින් භාරගනු නොලැබේ.

**05. ලෝගුව/හිස්වැස්ම/බාපනය ආපසු බාරදීම :**

2023 ජූලි මස 19 දින උපාධි ප්‍රදානෝත්සවයේ සැසිය අවසන් වූ පසු කොළඹ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ ස්ථාපනය කර ඇති විශේෂ කවුන්ටරයට ලෝගුව/හිස්වැස්ම/බාපනය භාරදිය හැකිය.

එදිනට ලෝගුව/හිසුවැස්ම/බාපනය භාර දීමට නොහැකි නම් 2023 ජූලි මස 20 දින සිට 22 වන දින තෙක් පෙ.ව 09.30 සිට ප.ව. 03.30 දක්වා) නාවල, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ විභාග අංශයට පැමිණ ලෝගුව/හිස්වැස්ම/බාපනය ආපසු භාරදීමට හැකිය.

2023 ජූලි මස 22 වන දින හෝ ඊට පෙර ලෝගුව/හිස්වැස්ම/බාපනය ආපසු භාරදීමට අපොහොසත් වුවහොත් එම අයගෙන් දිනකට රු.500.00 ක ප්‍රමාද ගාස්තුවක් අය කරනු ලැබේ. යම් හෙයකින් ලෝගුව/හිස්වැස්ම/බාපනය අස්ථානගත වුවහොත් හෝ හානියක් සිදු වුවහොත් එහි වටිනාකමට අමතරව 25% ක ගාස්තුවක් දෙපාර්තමේන්තු ගාස්තු වශයෙන් අය කරනු ලැබේ.

<u>**කිසිදු හේතුවක් මත ලෝගුව/හිස්වැස්ම/බාපනය ප්‍රාදේශීය/ අධ්‍යයන මධ්‍යස්ථානයන් වෙත භාර දීම සිදුකළ නොහැකි බව කාරුණිකව සලකන්න.**</u>

**06. සහතික පත් නිකුත් කිරීම :**

2023 ජූලි මස 19 දින උපාධි ප්‍රදානෝත්සවයේ සැසිය අවසන් වූ පසු කොළඹ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ ස්ථාපනය කර ඇති විශේෂ කවුන්ටරය මගින් උපාධි සහතික පත්‍රය නිකුත් කරනු ලැබේ.

නොඑසේ නම් 2023 ජූලි මස 20 දිනෙන් පසු සතියේ දිනවල (පෙ.ව. 09.30 සිට ප.ව. 03.30 දක්වා) නාවල, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ විභාග අංශයෙන් ශිෂ්‍ය වාර්තා පොත ඉදිරිපත් කිරීමෙන් පසු උපාධි සහතික පත්‍රය ලබා ගත හැකිය.

**ලෝගුව/හිස්වැස්ම/බාපනය ආපසු භාරදෙන තුරු ඔබගේ උපාධි සහතිකය නිකුත් නොකරන බව කරුණාවෙන් සලකන්න.** කරුණාකර මේ සඳහා පැමිණෙන විට ඔබගේ අනන්‍යතාවය තහවුරු කිරීමට ජාතික හැඳුනුම්පත හා ශිෂ්‍ය වාර්තා පොත රැගෙන ආ යුතුය.

**උපාධි සහතික පත්‍රය නිකුත් කරනු ලබන්නේ උපාධිලාභියා වෙත පමණි**. ඔහුට හෝ ඇයට තමා වෙනුවට වෙනත් අයෙකු ඉදිරිපත් කර සහතිකය ලබාගැනීමට කිසිඳු අවකාශයක් නොමැත.

## 07. උපාධිලාභීන් සමීක්ෂණය (Tracer Study)

මෙම ලිපිය සමග එවා ඇති උපාධිලාභීන් සමීක්ෂණ පත්‍රිකාව **(Tracer Study)** සම්පූර්ණ කර භාරදීම අනිවාර්ය බව කාරුණිකව දන්වා සිටිමි. උපාධිලාභීන් සමීක්ෂණ පත්‍රිකාව සම්පූර්ණ කර භාරදෙන තෙක් ලෝගුව/හිස්වැස්ම/බාපනය නිකුත් නොකරන බව සලකන්න.

## 08. පෙරහුරුව හා පෙරහැර

උපාධි ප්‍රදානෝත්සවයේ පෙරහුරුවක් නොපැවැත්වේ. එබැවින්, උපාධි ප්‍රදානෝත්සවයේ කටයුතු සාර්ථක කර ගැනීම සඳහා **2023 ජූලි මස 19 වන දින ප.ව 02.30 ට බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලා භූමියේ ප්‍රධාන ශාලාව අසලට** පැමිණ ඔබගේ අංකය අනුව පෙරහැර සඳහා පෙළ ගැසිය යුතුය. කුමන හේතුවක් නිසා හෝ ඔබ වෙන් කර ඇති ස්ථානය හෝ අංකය වෙනස් නොකළ යුතුය.

## 09. ප්‍රවේශ පත්‍ර

2023 ජූලි මස 19 වන දින උපාධි ප්‍රදානෝත්සවයට සහාභාගි වීම සඳහා සියලු පශ්චාත් උපාධි/ පශ්චාත් උපාධි ඩිප්ලෝමා/ ප්‍රථම උපාධිලාභීන් සඳහා එක් ප්‍රවේශ පත්‍රයක් ද, පශ්චාත් උපාධි ඩිප්ලෝමාලාභීන්ගේ අමුත්තන් සඳහා එක් අවසර පත්‍රයක්ද, පශ්චාත් උපාධි/ ප්‍රථම උපාධිලාභීන්ගේ අමුත්තන් සඳහා අවසර පත්‍ර දෙකක්ද, රථ වාහන අවසර පත්‍රයක් ද මේ සමඟ එවා ඇත. අවුරුදු 8 න් පහළ ළමුන් ශාලාව තුළට ඇතුල් කිරීමට අවසර දෙනු නොලැබේ. ජංගම දුරකතන හෝ ඉලෙක්ට්‍රොනික උපකරණ ශාලාව තුළට රැගෙන ඒම තහනම්ය.

උපාධි ප්‍රදානෝත්සවයට ඔබ සමඟ පැමිණෙන අමුත්තන් අසුන් ගැනීමෙන් පසු කිසිඳු අවශ්‍යතාවයක් සඳහා උත්සවය අවසාන වන තෙක් උත්සව ශාලාවෙන් නැගිට යාමට අවසර දෙනු නොලැබේ.

සියලුම උපාධි අපේක්ෂක අපේක්ෂිකාවන් සහ පැමිණෙන අමුත්තන් අනන්‍යතාවය තහවුරු කර ගැනීම සඳහා ඉදිරිපත් කරනු ලබන ජාතික හැඳුනුම්පතේ සඳහන් ආකාරයට පැහැදිලි ලෙස මුහුණ හඳුනාගත හැකි වන සේ පැමිණිය යුතුය.

## 10. ඡායාරූප ගැනීමේ තහනම

උපාධි ප්‍රදානෝත්සව ශාලාව තුළ ඡායාරූප ගැනීම තහනම් වන අතර, කිසිඳු හේතුවක් නිසා ඡායාරූප උපකරණ ශාලාව තුළට රැගෙන යාමද සම්පූර්ණයෙන් තහනම් වේ.

## 11. ආචාරශීලී බව

ආචාර්යවරුන් හා නිලධාරීන්ගෙන් සමන්විත පෙරහැරට අනතුරුව පැමිණෙන කුලපතිතුමාගේ පෙරහැර ශාලාව තුළට පිවිසෙන විට ශාලවේ සිටින සියලුදෙනා නැගී සිටිය යුතුය. උපාධි ප්‍රදානෝත්සවය අවසන්වන තුරු කිසිවෙකු ශාලාවෙන් පිටතට නොයා යුතුය.

උපාධි ප්‍රදානෝත්සවය අවසන් කිරීමට කුලපතිතුමා නැගී සිටින විට සියලුදෙනාම නැවත තම අසුන් වලින් නැගිට කුලපතිතුමා ශාලාවෙන් පිටව යන තුරු එසේ සිටිය යුතුය.

උපාධි ප්‍රදානෝත්සව ශාලාවේ දී උපාධිලාභීන්ගේ නම් අනුපිළිවෙලට කියවනු ලැබේ. (උපාධි උත්සවය පිළිබඳ විශ්වවිද්‍යාලයේ වෙබ් අඩවියේ දක්වා ඇති නාම ලේඛනය අනුව) ඔබගේ නම කියවීමට පෙර අසුනෙන් නැගිට වේදිකාවට පිවිසීමට ඇති පියගැටපෙළ අසල පේළි සැදී සිටිය යුතුය. ඔබගේ නම කියවුනු විට ඉතා සංවර ලීලාවෙන්, විනීතව කුලපතිතුමා ඉදිරියට ගොස් උපාධි මංජුසාව පිරිනැමූ පසු හිස නමා ආචාර කොට ආපසු පැමිණ ඔබට නියමිත අසුනේ අසුන්ගත යුතුය.

## 12. ඇඳුම

පිරිමි උපාධිලාභීන් ජාතික ඇඳුමෙන් හෝ කබායක් හා ටයිපටියක් ද සහිත බටහිර පන්නයට හෝ සැරසී සිටිය යුතුය. කාන්තා උපාධිලාභීන් වර්ණවත් සාරියකින් සැරසී සිටිය යුතුය. බෞද්ධ භික්ෂූන් වහන්සේලා හැර සෙසු සියලුම උපාධිලාභීන් තමාට අදාළ ලෝගුවෙන් සැරසී සිටිය යුතුය. පශ්චාත් උපාධිලාභීන් දුඹුරු පැහැති ලෝගුවෙන්ද, පශ්චාත් උපාධි ඩිප්ලෝමාධාරීන් කළු පැහැති ලෝගුවට අමතරව බාපනයකින් සැරසී සිටිය යුතු අතර සෙසු උපාධිලාභීන් කළු පැහැති ලෝගුව සහ හිස් වැස්ම පැළඳ සිටිය යුතුය.

## 13. සමූහ ඡායාරූපය

උපාධි උත්සවය අවසන් වූ වහාම සමූහ ඡායාරූපයට පෙනී සිටිය යුතුය. මෙහිදී ඡායාරූප ලබා ගැනීම සම්බන්ධව මේ සමඟ ඇති ලිපිය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

## 14. සෞඛ්‍ය උපදෙස්

සියලු උපාධිලාභීන් සහ අමුත්තන් COVID-19 වැළැක්වීම සම්බන්ධයෙන් සෞඛ්‍ය අංශ විසින් පනවා ඇති විධිවිධාන පිළිපැදිය යුතුය.

## 15. විශේෂ උපදෙස්

ඉහත කරුණුවලට අමතරව සියලු උපාධිලාභීන් උපාධි ප්‍රදානෝත්සවය ආරම්භ කිරීමට පෙර ලබාදෙනු ලබන උපදෙස් ද අනුගමනය කල යුතුය.

ස්තුතියි

මෙයට විශ්වාසී

සහකාර ලේඛකාධිකාරී/ විභාග

*හිස්වැස්ම අදාළ වන්නේ ප්‍රථම උපාධි ලාභීන්ට පමණි.

**බාපනය අදාළ වන්නේ පශ්චාත් උපාධි ඩිප්ලෝමා ලාභීන්ට පමණි